සැ. යු.- 2011.06.17 වැනි දින පළ වූ අංක 1,711 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,712 - 2011 ජුනි මස 24 වැනි සිකුරාදා - 2011.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 280 |


*සැ. යු.-* (i) මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ ශාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 ජුනි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 ජුනි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජුනි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## "සිත් සෙවන" මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

......................................වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "සිත් සෙවන" මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී........................................ සංස්ථාගත කිරීමයි.

1. මන්ද මානසික දරුවන් සඳහා අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය ආගමික, සංස්කෘතික සමාජීය, ක්‍රීඩා යන කරුණු පෙරදැරි කර ගනිමින් මන්ද මානසික දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම.
2. මන්ද මානසික දරුවන්ගේ වෘත්තීමය කුසලතා වර්ධනය කිරීම හා ඔවුන් සමාජානුගත කිරීම මන්ද මානසික වැඩිහිටි පුද්ගලයින් සඳහා නේවාසික මධ්‍යස්ථාන ආරම්භ කොට නේවාසික පහසුකම් ලබා දීම.
3. අප සංවිධානයට අයත් මධ්‍යස්ථානවලට ඇතුලත් කර ගැනීමට නොහැකි දරුවන්ගේ දෙමාපියන්ට ඔවුන්ගේ වෘත්තීමය කුසලතා සලකා බලා ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට මුල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාරයක් ලබා දීම හා දරුවන්ගේ නඩත්තුව සඳහා යම් මුල්‍යමය ආධාරයක් සපයා දීම. අප සංවිධානයේ අධීක්ෂණය යටතේ එම පුද්ගලයින්ට ද සහනයක් ලබාදීම යනාදිය වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී

06-512

---

## මෙත් සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

..........................................වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ මෙත් සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි. යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී...................................... සංස්ථාගත කිරීමයි.

1. හදිසි ආපදා හා ස්වභාවික විපත් වලින් පීඩාවට පත්වූවන් සඳහා උපකාර කිරීම.
2. විශේෂ රෝගාභාධ ඇති පුද්ගලයින් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට මුල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දීම. වෛද්‍ය කඳවුරු හා සායන පැවැත්වීම.
3. අධ්‍යාපනය ලබන දිළිඳු දරුවන් සඳහා ශිෂ්‍යත්ව, දේශන හා අතිරේක පංති මෙන්ම පුස්තකාල පහසුකම් ලබා දීම, කායික හා මානසික වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම යනාදිය වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී.

06-513

---

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් (කොළඹදී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 270 වැනි වගන්තිය යටතේ හා ඒ අනුව කරනු ලබන ඉල්ලීමයි

1. දිසානායක මුදියන්සෙලාගේ විමලසිරි
2. මාතරගේ සුචිත්‍රා ප්‍රියදර්ශනී

දෙදෙනාම

අංක 167/8/ඒ,
නීලම්මහර පාර,
බොරලැස්ගමුව

..............................................පෙත්සම්කරුවන්.

නඩු අංක : HC (civil) 20/2011
ස්වභාවය : CO
කාර්යපටිපාටිය : ළඝු
වටිනාකම : රු. 2,032,750

- එදිරිව -

සෙලින්කෝ ප්‍රින්ටින් ඇන්ඩ් ස්ටේෂනරි (පුද්ගලික) සමාගම,
අංක 257, යූනියන් පෙදෙස,
කොළඹ 02.

..................................................වගඋත්තරකරු.

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පවත්වන ලද බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් වගඋත්තරකාර සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා බොරලැස්ගමුව, නීලම්මහර පාර, අංක 167/8/ඒ දරන ස්ථානයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ විමලසිරි සහ මාතරගේ සුචිත්‍රා ප්‍රියදර්ශනී යන පෙත්සම්කරුවන් විසින් 2011 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින දී එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2011 අප්‍රේල් මස 27 වැනි දින අධිකරණය ඉදිරියේ කරුණු තහවුරු කරනු ලදුව එකී ඇවර කිරීමට නියෝගයන් කිරීමට පෙරාතුව පුවත්පත් දැන්වීම පළ කිරීමට කොළඹ වාණිජ මහාධිකරණයේ ගරු මහාධිකරණ විනිසුරුතුමන් නියෝග කර ඇත. ඒ අනුව ඉහත සඳහන් වගඋත්තරකාර සමාගම ඇවර කිරීමට පක්ෂව සහය දීමට හෝ එයට විරුද්ධව සහය නොදීමට (ඇවර කිරීමට විරුද්ධ වන) කැමැත්තක් දක්වන සියලුම තැනැත්තන් එකී සමාගමේ ණයහිමියන් හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පෞද්ගලිකව හෝ සිය නීතිඥයෙකු මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ බුද්ධික සේරසිංහ,
අංක 34/53, නීතිඥ කාර්යාල සංකීර්ණය,
ශාන්ත බස්තියම කන්ද,

කොළඹ 12.

සටහන : එකී පෙත්සම සම්බන්ධව විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති අදහස ඉහත නම සඳහන් නීතිඥ බුද්ධික සේරසිංහ, අංක 34/53, නීතිඥ කාර්යාල සංකීර්ණය, ශාන්ත බස්තියම කන්ද, කොළඹ 12, නීතිඥ මහතාට ලිඛිතව දන්වා බාර දිය යුතු ය. නැතහොත් තැපෑලන් එවිය යුතු ය. දැන්වීම කරනු ලබන්නේ පුද්ගලයෙකු නම් නම හා ලිපිනය ද, නැතහොත් සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය ද, දැන්වීමේ ප්‍රකාශ කල යුතු අතර පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥයෙකු සිටී නම්) නීතිඥවරයා හෝ නීතිඥවරිය විසින් අත්සන් කල යුතු අතර 2011.07.10 වැනි දින ප.ව. 1.00 පෙර භාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් ප්‍රමාණවත් කාලයක් තුල (ඉහත නම සඳහන් නීතිඥවරයාට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතු ය.

06-556

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.